**මීගමුව අධ්‍යාපන කලාපය**

**දෙවන වාර ඇගයීම -2025**

**භූගෝල විද්‍යාව**

විභාග අංකය / නම : ..........................................................................................................

| 10 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව I , II | කාලය පැය 03 |
| --- | --- | --- |

**භූගෝල විද්‍යාව I**

- **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.**
- **එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 5 දක්වා ප්‍රශ්න වල එක් එක් හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(1) පෘථිවියේ මුළු භූමි ප්‍රමාණයෙන් ................................ ක් ගොඩබිම් ය.
(20% / 29% / 71%)

(2) වායු ගෝලයේ මුළු වායු පරිමාවෙන් 50%ක් පමණ අන්තර්ගත වන්නේ පෘථිවි තලයේ සිට ................................ km ක් අතර කලාපයේ ය.
(2 - 3 / 4 - 5 / 5 - 6)

(3) ................................ ගංගාව ග්ලැසියර දිය වූ ජලයෙන් ආරම්භ වන ගංගාවකි.
(රයින් / කොංගෝ / ඇමේසන්)

(4) සාගර ජලයෙන් ඉහළට නැගුණ විශාල භූමි ස්කන්ධ ................................ වේ.
(දූපත් / මහාද්වීප /තැනිතලා)

(5) ශ්‍රී ලංකාවේ ................................ m ට අඩු උස්බිම් රබර් වගාව සඳහා යොදා ගනී,
(30 / 300 /3000)

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

(6) ග්‍රැනයිට් පාෂාණවලින් සමන්විත පෘථිවි මහද්වීපික කබොල 'සිමැග්' (Simag) ස්තරය ලෙස ද හැඳින් වේ. (නි / වැ)

(7) ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ උත්තර අර්ධ ගෝලය තුළ ය. (නි / වැ)

(8) රතු මුහුද සහ කළු මුහුද සම්පූර්ණයෙන්ම ගොඩබිමින් වට වූ මුහුදුවලට උදාහරණ වේ. (නි / වැ)

(9) තුන්ද්‍රා දේශගුණය, සෞම්‍ය දේශගුණයේ විශේෂිත දේශගුණ වර්ගය කි. (නි / වැ)

(10) ලෝකයේ පැරණිතම භූමි පරිභෝග ක්‍රමයක් ලෙස සත්ත්ව පාලනය සැලකේ. (නි / වැ)

- **අංක 11 සිට 16 ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

(11) මැඩගස්කර දූපත ........................................ මහාද්වීපික තටකය තුළ පිහිටා ඇත.

(12) ලෝකයේ විශාලම විල ........................................ වේ.

(13) පෘථිවි ශිලා ගෝලය විශාල භූ තැටි ...................................... කින් සමන්විත වේ.

(14) ලොව වැඩි වශයෙන් නිෂ්පාදනය හා පරිභෝජනය කරන ධාන්‍ය වර්ගය ..........................වේ.

(15) පස තුළ අන්තර්ගතව ඇති ජලය ........................................ ලෙස හැඳින් වේ.

(16) ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියම් පත්‍රයකින් නිරූපිත භූමියේ විශාලත්වය ......................$km^2$ කි.

❖ **අංක (17) සිට (19) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රස්ථාරය යොදාගන්න**




(17) ඉහත ප්‍රස්ථාරයට අනුව ඉහළම තේ නිෂ්පාදනයක් සහිත වර්ෂය කුමක් ද? ...........................

(18) තේ නිෂ්පාදනයේ අඩුම අගය සඳහන් වන්නේ කිනම් වර්ෂයේ ද? ..................

(19) ප්‍රස්ථාරයට අනුව 2010 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේ අගය කොපමණ ද? ............

❖ **අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්න වල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක් වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැලපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

| අ | ආ |
|---|---|
| (20) <u>මහද්වීප තටකය</u> | <u>දූපත</u> |
| 1. ආසියා මහද්වීපික තටකය | A - සුමාත්‍රා |
| 2. අප්‍රිකා මහද්වීපික තටකය | B - සයිප්‍රස් |
| 3. ඔස්ට්‍රේලියා මහද්වීපික තටකය | C - මැඩගස්කරය |
| | D - පැපුවා නිව්ගිනියා |

(i) A , B , C  (ii) A , C , D  (iii) B , C , D  (iv) C , D , B  (........)

| අ | ආ |
|---|---|
| (21) <u>කඳු</u> | <u>පිහිටීම</u> |
| 1. ඇට්ලස් | A - දකුණු ඇමරිකාව |
| 2. රොකී | B - යුරෝපය |
| 3. ඇල්ප්ස් | C - අප්‍රිකාව |
| | D - උතුරු ඇමරිකාව |

(i) A , C , B  (ii) C , A , B  (iii) C , D , B  (iv) D , C , B  (........)

අ ආ

(22) **<u>බෝගය</u>** **<u>පර්යේෂණායතනය පිහිටා ඇති ස්ථානය</u>**

1. වී
2. තේ
3. සුළු අපනයන බෝග

A - මාතලේ
B - ලබුකැලේ
C - බෝඹුවල
D - තලවාකැලේ

(i) A , B , C  (ii) B , C , D  (iii) C , D , A  (iv) D , C , A  (........)

**<u>අ</u>** **<u>ආ</u>**

(23) **<u>දිස්ත්‍රික්කය</u>** **<u>වී වගා කලාපය</u>**

1. බදුල්ල
2. රත්නපුරය
3. මහනුවර

A - කඳුරට බිම්
B - වියළි කලාපය
C - අතරමැදි කලාපය
D - තෙත් කලාපය

(i) A , D , C  (ii) C , B , A  (iii) D , A , B  (iv) C , D , A  (........)

**<u>අ</u>** **<u>ආ</u>**

(24) **<u>විල</u>** **<u>පිහිටි මහද්වීපය</u>**

1. බයිකල්
2. අයර්
3. ටිටිකාකා

A - ඕස්ට්‍රේලියා
B - දකුණු ඇමරිකා
C - ආසියා
D - උතුරු ඇමරිකා

(i) A , B , C  (ii) B , C , D  (iii) C , A , B  (iv) D , A , B  (........)

❖ **අංක 25 සිට 37 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

(25) උන්නතාංශය අනුව ඉහළ යන සෑම මීටර් 1000 කටම $6.4^0c$ බැගින් උෂ්ණත්වය අඩු වීම සිදු වන්නේ කුමන ගෝලයේ ද?
(i) ජල ගෝලය  (ii) අපරිවර්තී ගෝලය
(iii) පරිවර්තී ගෝලය  (iv) මෙසෝ ගෝලය  (........)

(26) මින් අභ්‍යන්තර මුහුදක් වන්නේ කුමක්ද?
(i) රතු මුහුද  (ii) ඒරල් මුහුද
(iii) අරාබි මුහුද  (iv) කහ මුහුද  (........)

(27) 'නොරින් 10' යනු,
(i) වී විශේෂයකි  (ii) රටකජු විශේෂයකි
(iii) තිරිඟු විශේෂයකි  (iv) පොල් විශේෂයකි  (........)

(28) ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි මෙට්‍රික් සිතියම් කොපමණ ප්‍රමාණයක් නිර්මාණය කර ඇත් ද?
(i) 82  (ii) 92  (iii) 104  (iv) 152  (........)

(29) මහා බාධක කඳුවැටිය පිහිටි මහද්වීපය කුමක්ද?
(i) ඕස්ට්‍රේලියා  (ii) අප්‍රිකා
(iii) ආසියා  (iv) යුරෝපා  (........)

(30) ශ්‍රී ලංකාවේ තේ අපනයනයේ ප්‍රධාන ගැණුම්කරුවා වන්නේ,
(i) ජපානය යි  (ii) ඕස්ට්‍රේලියාව යි
(iii) රුසියාව යි  (iv) මැදපෙරදිග යි  (........)

(31) ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග හා සම්බන්ධ නොගැලපෙන පිළිතුර කුමක්ද?

(i) මල් වර්ග - නුවරඑළිය (ii) කජු - මන්නාරම
(iii) කරාබුනැටි - මහනුවර (iv) ගම්මිරිස් - මොණරාගල (........)

(32) ශ්‍රී ලංකාවේ වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගන්නේ,
(i) වෙරළාසන්න කලාපයේ ය. (ii) ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තයෙනි
(iii) මිරිදිය ධීවර කර්මාන්තයෙනි. (iv) කිවුල් දිය ධීවර කර්මාන්තයෙනි (........)

(33) ශ්‍රී ලංකාවේ මුල්ම රබර් පැලය රෝපණය කල ස්ථානය වන්නේ,
(i) ගම්පහ අස්ගිරිය හෙනරත්ගොඩ උද්‍යානයේ දී ය.
(ii) පේරාදෙණිය උද්භිද උද්‍යානයේ දී ය.
(iii) අවිස්සාවේල්ල සීතාවක උද්භිද උද්‍යානයේ දී ය.
(iv) නුවරඑළිය හග්ගල උද්භිද උද්‍යානයේ දී ය. (........)

(34) ලෝකයේ විශාලම දූපත වන්නේ,
(i) ශ්‍රී ලංකාව (ii) මැඩගස්කරය
(iii) අයිස්ලන්තය (iv) ග්‍රීන්ලන්තය (........)

(35) පැරණිතම සිතියම ලෙස හඳුන්වන මැටි පුවරුවක අඳින ලද සිතියම කුමන ශිෂ්ටාචාරයකට අයත් ද?
(i) මෙසපොතේමියානු (ii) නයිල් නිම්න
(iii) හොවැංහෝ (iv) ඉන්දුනිම්න (........)

(36) උත්ස්වේදනය මගින් වායුගෝලයට එක්වන්නේ,
(i) භූ තලය හා ජලතල මත ඇති ජලයයි (ii) පාංශු ජලයයි
(iii) භූගත ජලයයි (iv) ශාක පත්‍රවල අඩංගු ජලයයි (........)

(37) ජලගැලීම් මගින් වී වගාවට බහුලව හානි සිදුවන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයක් වන්නේ,
(i) කළුතර යි (iii) හම්බන්තොට යි
(iii) අනුරාධපුරය යි (vi) අම්පාර යි (........)

❖ **පහත A , B , C සහ D මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කර අංක 37 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A – 1. තොරතුරු සන්නිවේදනය
2. සමාජ සංවර්ධනය

B – 1. වන විනාශය
2. වගා බිම්

C – 1. ප්‍රමිතිරි අනුපාතය
2. ශ්‍රම බලකාය

D – 1. වියපත් ජන සංඛ්‍යාව
2. සුබසාධක වියදම්

(38) පළමු වැන්නේ වැඩිවීම දෙවැන්නේ ද වැඩි වීමට හේතු වන මාතෘකා යුගලය කුමක්ද?
(i) A (ii) B (iii) C (iv) D

(39) පළමුවැන්නේ දියුණුව දෙවැන්නේ යහපතට මෙන්ම අයහපතට ද හේතුවන මාතෘකා යුගලය කුමක්ද?
(i) A (ii) B (iii) C (iv) D

(40) දෙවැන්නේ අඩු වීම කෙරෙහි පළමුවැන්නේ වැඩිවීම බලපා ඇති මාතෘකා යුගලය කුමක් ද?
(i) A (ii) B (iii) C (iv) D

**භූගෝල විද්‍යාව II**

- ❖ **මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.**
- ❖ **I කොටසේ 1 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ), (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතු ය.**
- ❖ **II කොටසින් තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.**
- ❖ **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

<u>I කොටස</u>

**(1)**

**අ)**

(i) සිතියමක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) තේමා සිතියම් සඳහා උදාහරණ දෙකක් සපයන්න. (ලකුණු 02)

(iii) භූ ලක්‍ෂණ සිතියමක ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

(iv) 1:50,000 භූ ලක්‍ෂණ සිතියමක පර්යන්ත තොරතුරුවල අන්තර්ගත තොරතුරු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(v) භූ ලක්‍ෂණ සිතියම්වල සැබෑ උතුර හා චුම්භක උතුර දක්වා ඇති සංකේත පිළිවෙලින් ඇඳ දක්වන්න. (ලකුණු 02)

ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති තීරුව (පිටු අංක 07) යොදා ගන්න.

❖ අංක i සිට v තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| i. | රොකී කඳු වැටිය | C, D, E |
| ii. | මධ්‍යධරණී මුහුද | S, T, U |
| iii. | ඇමසන් ගඟ | G, H, F |
| iv. | මැඩගස්කර දූපත | P, Q, R |
| v. | ලොව විශාලතම සාගරය | I, J, K |

**ඉ)** සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව ඇති තීරුව (පිටු අංක 07) යොදා ගන්න.

❖ අංක i සිට v තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| i. | ත්‍රිකුණාමලය වරාය | A, B, C |
| ii. | තේ පර්යේෂණ ආයතනය පිහිටි දිස්ත්‍රික්කය වන නුවරඑළිය දැක්වෙන්නේ | D, E, F |
| iii. | බෝඹුවල වී පර්යේෂායතනය දැක්වෙන්නේ | G, H, I |
| iv. | කැලණි ගඟ | J, K, L |
| v. | ගව පාලනය සිදුකරන අම්පාර දිස්ත්‍රික්කය දැක්වෙන්නේ | M, N, O |

## II කොටස

(2) (i) වායුගෝලය යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02)

(ii) වායුගෝලයේ වැඩිම ප්‍රතිශතයක් ඇති වායු වර්ග තුන පිළිවෙලින් දක්වන්න. (ලකුණු 03)

(iii) වායුගෝලය දූෂණය වීම කෙරෙහි බලපාන මිනිස් ක්‍රියාකාරීත්වයන් 03ක් නම් කර, වායු දූෂණය වළක්වාලීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(3) (i) ජෛවගෝලය යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02)

(ii) ජෛවගෝලයේ සීමාවන් කෙටියෙන් දක්වන්න. (ලකුණු 03)

(iii) ජෛවගෝලයට තර්ජනයක් වී ඇති මානුෂ ක්‍රියාකාරකම් තුනක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(4) (i) ලෝක දේශගුණ වර්ගීකරණ ඉදිරිපත් කරනු ලැබූ පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) ලෝකයේ ප්‍රධාන දේශගුණ කලාප තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) ඔබ ඉහතින් සඳහන් කල කලාප තුන අතුරෙන් එකක් තෝරාගෙන එහි භෞතික ලක්‍ෂණ පිළිබඳ සැකවින් විස්තර කරන්න. (ලකුණු 05)

(5) (i) වතු කෘෂිකර්මය යනු කුමක්ද? (ලකුණු 02)

(ii) වතු කෘෂිකර්මයේ විශේෂ ලක්‍ෂණ 03ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) (අ) ව්‍යාපාරික කිරි පට්ටි පාලනය සිදු කරන ප්‍රධාන රටවල් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ආ) ව්‍යාපාරික කිරි පට්ටි පාලනය හා බැඳී පවතින විශේෂ ලක්‍ෂණ 03ක් දක්වන්න. (ලකුණු 03)

(6) (i) තේ වගාව සඳහා අවශ්‍ය භෞතික සාධක 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය හා සම්බන්ධයෙන් උද්ගත වී ඇති ගැටලු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ දියුණුවට රජය ගෙන ඇති පියවර තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(7) (i) තිරිඟු වගාව සඳහා බලපාන භෞතික සාධක 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ලෝකයේ තිරිඟු නිෂ්පාදනය කරන ප්‍රධානතම රටවල් 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) තිරිඟු වගාවේ දියුණුවට බලපා තිබෙන හේතු 03 ක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(8) (i) ධීවර කර්මාන්තයට අයත් වන ප්‍රධාන අංශ 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ධීවර කර්මාන්තය සඳහා ශ්‍රී ලංකාව තුළ පවතින හිතකර සාධක 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (අ) කෘෂිකර්මාන්තයේ දී මතු වන භූමි පරිභෝග ආශ්‍රිත ගැටලු 02 ක් දක්වන්න. (ලකුණු 02)

(ආ) කෘෂිකර්මාන්තයේ නිෂ්පාදනය ආශ්‍රිත ගැටලු 03 ක් නම් කරන්න. (ලකුණු 03)

**භූගෝල විද්‍යාව II**

**<u>I කොටස</u>**

**(01)**

**අ)**




**ආ)**

